# තනතුරු - ඇබෑර්තු

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

(කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

01. තනතුර : කථිකාචාර්ය II - තනතුරු 02

01. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

02. අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වසර 04 ක සමාජ වැඩ පිළිබඳ උපාධිය/සාමාජීය විද්‍යාවන්ගෙන් ලබා ගත් විශේෂ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම;
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ/සාමාජීය විද්‍යාවන් සහිත ශාස්ත්‍රවේදී උපාධියක් සමග අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | නිර්නායකය | ලකුණු |
|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම්වලට අතිරේකව) | 30 |
| 2 | ඉගැන්වීම් පළපුරුද්ද | 10 |
| 3 | පර්යේෂණ හා ප්‍රකාශන | 20 |
| 4 | විෂය බාහිර ක්‍රියාකාරකම් | 10 |
| 5 | පෞරුෂය | 15 |
| 6 | අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය දැනුම | 15 |
| | එකතුව | 100 |

04. වැටුප් පරිමාණය : AR-1 (රු. 53,150- 10 x 1,375 - 15 x 1,910 - රු. 95,550)

තනතුර සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :-

1. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2. තනතුරු ස්ථිරය
3. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
4. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

*සටහන* : මෙම තනතුර පුරප්පාඩුව පවතින්නේ සීදුව ප්‍රධාන කාර්යාලයේ වන අතර තෝරා ගන්නා අය ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතුය.

සේවා කොන්දේසි : 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා රෙගුලාසිවලට යටත් විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත ලිපිනයට **2024.06.14 දින** හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලිපිකවරයේ වම් පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය. අසම්පූර්ණ, අපැහැදිලි හෝ

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ආචාර්ය රවීන්ද්‍ර විතානාච්චි,
අධ්‍යක්ෂ ජනරාල් (*වැ. බ.*)
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2024 මැයි මස 21 වැනි දින,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
ලියනගේමුල්ල,
සීදුව.